# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/35 - 2023 අගෝස්තු මස 15 වැනි අඟහරුවාදා - 2023.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(x)(ඇ).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ සහ 70ඇ වගන්ති සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී.වී. 66705 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම (KAATSU-Highly Advanced Medical Technology Training center (pvt) Ltd) (KIU) සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසු, සහ එකී කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම 2023 මැයි මස 26 වන දින දරන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකය යටතේ කේ. අයි. යූ. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් සංස්ථාගත කරන ලද බැවින්ද, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද 2015 ජනවාරි මස 7 වන දින අංක 1896/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ "සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම (KAATSU-Highly Advanced Medical Technology Training center (pvt) Ltd) (KIU)" යන වචන දැක්වෙන සෑම තැනකම ඒ වෙනුවට, "කේ. අයි. යූ. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන වචන ආදේශ කිරීමෙන් ඒ නියෝගය මෙයින් සංශෝධනය කරනු ලබන අතර ඉහත කී වගන්ති ප්‍රකාර මින් පෙර කරනු ලැබ ඇති යම් නියමයක, දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම" සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක්ම "කේ. අයි. යූ. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

තව ද, මේ නියෝගය ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම, 2015 ජනවාරි මස 7 වන දින අංක 1896/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම වෙත පැවරී ඇති යම් බලයක් ප්‍රකාරව, එකී සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද යම් බලයක්, හෝ කරන ලද යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් සියලු කාර්යය සඳහා, කේ. අයි. යූ. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වලංගු ලෙස ක්‍රියාත්මක කරන ලද සේ සහ කරන ලද සේ සලකනු ලැබිය යුතු බවට ද මෙයින් නියම කරනු ලැබේ.

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2023 අගෝස්තු මස 10 වන දින,
කොළඹ දී ය.

EOG 08 - 0161